


# පාර්ලිමේන්තු විත්ති

**පුවත් හසුන**
**8 වන කාණ්ඩය**
**පෙබරවාරි 2021**


01 මහජන පෙත්සම් කාරක සභාව රැස්වේ

02 කරුණු දැක්වීමට ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයට කෝප් කමිටුවෙන් මාසයක කාලයක්

03 උපදේශක කාරක සභා දෙකකට නව සාමාජිකයෝ පත් කෙරෙති


06 රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව සහ එහි කර්තව්‍ය

11 අපරාධ නීතිය, සිවිල් නීතිය සහ වාණිජ නීතිය ප්‍රතිසංස්කරණයට කමිටු 03ක්

13 අමාත්‍යාංශ ලේකම්වරුන් සිවු දෙනෙකුට සහ තානාපතිවරුන් දෙදෙනෙකුට පාර්ලිමේන්තුවේ උසස් නිලතල පිළිබඳ කාරක සභාවේ අනුමැතිය



සන්නිවේදන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව



# මහජන පෙත්සම් කාරක සභාව රැස්වේ

කොවිඩ් අභියෝගය හේතුවෙන් පෙත්සම්කරුවන් පාර්ලිමේන්තුවට කැඳවා ඔවුන්ගේ අභියාචනා සැලකිල්ලට ගැනීමට නොහැකි වුවද, පසුගිය පාර්ලිමේන්තුවේදී පෙත්සම් කාරක සභාව ලබා දී තිබූ තීරණ ක්‍රියාත්මක කර ඇත්දැයි විමර්ශනය කිරීමට එම කාරක සභාව තීරණය කර තිබේ.

ඒ අනුව පසුගිය පෙබරවාරි 25 වැනිදා මහජන පෙත්සම් කාරක සභාව එහි සභාපති අමාත්‍ය ගාමිණී ලොකුගේ මහතාගේ ප්‍රධානත්වයෙන් පාර්ලිමේන්තුවේදී රැස්විය.

එම රැස්වීම සඳහා අදාළ නියෝග නිකුත් කර තිබූ රාජ්‍ය ආයතනවල නිලධාරීන් පමණක් කැඳවා තිබූ අතර, පසුගිය පෙත්සම් කාරක සභාව විසින් ලබා දී තිබූ නියෝග 06ක් ක්‍රියාත්මක කර ඇති ආකාරය සමාලෝචනයට ලක් කිරීම මෙහිදී සිදුවිණි. මේ ආකාරයටම මාර්තු මාසය තුළදී ද පෙත්සම් කාරක සභාව රැස්වී පසුගිය නියෝග සමාලෝචනය කරනු ඇත.

පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් මඟින් මහජන පෙත්සම් කාරක සභාවට යොමුවන පෙත්සම් කඩිනමින් විභාග කිරීම සඳහා අනු කමිටු පත්කර එම පෙත්සම් විභාග කිරීමට පියවර ගන්නා ලෙස රාජ්‍ය අමාත්‍ය ජයන්ත සමරවීර මහතා ද  පාර්ලිමේන්තුවෙන්  ඉල්ලීමක් කළේය.

> " මාර්තු මාසය තුළදීද පෙත්සම් කාරක සභාව රැස්වී පසුගිය නියෝග සමාලෝචනය කරනු ඇත. "

මෙම යෝජනාව මහජන පෙත්සම් කාරක සභාවේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන බව කථානායක මහින්ද යාපා අබේවර්ධන මහතා මේ අවස්ථාවේ සඳහන් කළේය.

මහජන පෙත්සම් කාරක සභාවේ ලේකම් සේනක කුලුගම්මන මහතා ඇතුළු පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලයීය සාමාජිකයන්ද මේ අවස්ථාවට සහභාගී වූහ.

# කරුණු දැක්වීමට ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයට කෝප් කමිටුවෙන් මාසයක කාලයක්

**පුවත්**



***ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය සම්බන්ධයෙන් වූ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා රැස්වීම (කෝප් කමිටුව) අතරමඟ අත්හිටුවීමට පියවර ගත් එම කාරක සභාව නැවත මාසයක් ඇතුළත කරුණු විමසීම සඳහා සූදානම්ව පැමිණෙන ලෙස එම ආයතනයට දැනුම් දුන්නේය.***

ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ 2017 සහ 2018 මූල්‍ය වර්ෂ සඳහා විගණකාධිපති වාර්තාව සහ එහි වර්තමාන කාර්ය සාධනය පිළිබඳ පරීක්ෂා කිරීමට මෙම කාරක සභා රැස්වීම පසුගිය පෙබරවාරි 11වනදා කැඳවා තිබූ අතර, එම ආයතනය විගණන විමසුම් සඳහා නිසි සූදානමකින් තොරව පැමිණීම හේතුවෙන් මෙම තීරණය ගැනීමට කාරක සභා සාමාජිකයෝ තීරණය කළහ.

සභාපති මාහාචාර්ය චරිත හේරත් මහතාගේ ප්‍රධානත්වයෙන් පසුගියදා පැවැති රැස්වීමට අමාත්‍යවරුන් වන මහින්ද අමරවීර, මහින්දානන්ද අලුත්ගමගේ, රාජ්‍ය අමාත්‍යවරුන් වන ඉන්දික අනුරුද්ධ, අජිත් නිවාඩ් කබ්රාල්, නාලක ගොඩහේවා, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වන පාඨලී චම්පික රණවක, ජගත් පුෂ්පකුමාර, ඉරාන් වික්‍රමරත්න, ප්‍රේමනාත් සී.දොලවත්ත, එස්. රාසමාණික්කම් යන මහත්වරු සහභාගි වූහ.

ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ මූල්‍ය පරිපාලනය අවධිමත් වීම හේතුවෙන් ගැටලු රැසක් නිර්මාණය වී ඇති බව නිරීක්ෂණය වී ඇතැයි කාරක සභාවේ සභාපති මාහාචාර්ය චරිත හේරත් මහතා මෙහිදී සඳහන් කළේය. ශ්‍රී ලංකා ක්‍රිකට් සම්බන්ධව ජනතා අප්‍රසාදය ඉහළ ගොස් ඇති බවත් එය එක් පාර්ශවයකට පමණක් හිමි දෙයක් නොව රටට අයත් දෙයක් බවත් හෙතෙම අවධාරණය කළේය.

2017 වසර වන විට රුපියල් මිලියන 240 කට අධික මුදලක නොනිම් වැඩ වලට අදාළ කොන්ත්‍රාත් ගිවිසුම්, වැඩභාර ගැනීමේ ලිපි සහ වැඩ ආරම්භ කිරීම හා අවසන් කළ යුතු දිනය සම්බන්ධිත ලියවිලි විගණනයට ඉදිරිපත් නොකිරීම සම්බන්ධයෙන් කාරක සභා සාමාජිකයෝ ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයට දෝෂාරෝපණය කළහ. කාරක සභා රැස්වීමේදී හෝ එම ලිපි ගොනු නිවැරදිව ඉදිරිපත් කිරීමට ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය අපොහොසත් විය.

2020 වසර වන විට එලෙස විගණනයට ඉදිරිපත් නොකර තිබූ නොනිම් වැඩ වලට අදාළ ව්‍යාපෘතිවල වටිනාකම රුපියල් මිලියන 511ක් දක්වා ඉහළ යාම සම්බන්ධවද කාරක සභාවේ විශේෂ අවධානයක් යොමු විණි.

2018 වසරේදී දකුණු අප්‍රිකා - ශ්‍රී ලංකා ක්‍රිකට් සංචාරයට අදාළව අනුග්‍රාහක අයිතිය වෙනුවෙන් ලැබිය යුතු ආදායම වූ රුපියල් මිලියන 29ක මුදල මෙතෙක් අයකර නොගැනීම සම්බන්ධව කාරක සභාව ප්‍රශ්න කළ අතර, ඊට අදාළව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන් විමර්ශනයක් මේ වන විට ආරම්භ වී ඇති බව ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ සභාපති ෂම්මි සිල්වා මහතා කාරක සභාවට දැන්වීය.

මේ සම්බන්ධව පරීක්ෂණයක් පවත්වා එහි වාර්තාව මසක් ඇතුළත කාරක සභාවට ලබාදෙන ලෙස සභාපති මහාචාර්ය චරිත හේරත් මහතා තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශයේ ලේකම් අනුරාධ විජේකෝන් මහතාට දැනුම් දුන්නේය.

එම මුදල ඩයමන් චැනල් නම් ඇමෙරිකානු ජාතිකයෙකුගේ ගිණුමකට ඇතුළත්ව ඇති බවත්, එය සිදුවූයේ කෙසේද යන්න පිළිබඳව විමර්ශනවලදී අවධානය යොමුව ඇති බවත් කාරක සභාවේදී අනාවරණය විය.

චන්දික හතුරුසිංහ මහතා ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ ප්‍රධාන පුහුණුකරු ලෙස බඳවා ගැනීමට අදාළ ගිවිසුම දෝෂ සහිත බව පෙන්වා දුන් කාරක සභාව ඒ හේතුවෙන් හතුරුසිංහ මහතාව ඉවත් කිරීමෙන් පසු ඒ මහතා පවරා ඇති නඩුවට අදාළ නඩු ගාස්තු ලෙස ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය මේ වන විට රුපියල් මිලියන 20 ක් වියදම් කර ඇති බවද කාරක සභාවේදී අනාවරණය විණි.

**පුවත්**

# උපදේශක කාරක සභා දෙකකට නව සාමාජිකයෝ පත් කෙරෙති



***නවවැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි සභාවාරයේ දී තාක්ෂණ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේ සහ මහජන ආරක්ෂක කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේ සේවය කිරීම සඳහා තේරීම් කාරක සභාව මඟින් නම් කර ඇති මන්ත්‍රීවරයන්ගේ ලේඛනය කථානායක මහින්ද යාපා අබේවර්ධන මහතා පසුගියදා පාර්ලිමේන්තුවේදී නිවේදනය කළේය.***

පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 112 හි විධිවිධාන සහ 2021 ජනවාරි 07 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාව ප්‍රකාරව මෙම පත්කිරීම් සිදුකර තිබේ.

ඒ අනුව තාක්ෂණ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවට රාජ්‍ය අමාත්‍ය සුසිල් ප්‍රේමජයන්ත, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් වන (මහාචාර්ය) තිස්ස විතාරණ, මයන්ත දිසානායක, ඉම්රාන් මහරූෆ් සහ යදාමිණී ගුණවර්ධන යන මහත්වරුන් පත් කර තිබෙන බව කථානායකවරයා නිවේදනය කළේය.

මහජන ආරක්ෂක කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවට මෙලෙස පත් කළ නව සාමාජිකයන් අතර අමාත්‍ය සී. බී. රත්නායක, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් වන හෙක්ටර් අප්පුහාමි, අකිල එල්ලාවල, ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් සහ රෝහණ බණ්ඩාර යන මහත්වරුන් වෙති.

විශේෂාංග

# උගව වෙල්ලස්ස ප්‍රෞඪත්වය - හිටපු කථානායක වි.ජ.මු. ලොකුබණ්ඩාර මැතිතුමා



***හිටපු කථානායක වි.ජ.මු ලොකුබණ්ඩාර මැතිතුමා ශ්‍රී ලාංකේය දේශපාලනයේ නොමැකෙන මංපෙත් විවරකළ ප්‍රාමාණික විද්වතෙකි. දේශපාලනඥයෙකු ලෙස හෙතෙම දැක් වූ විද්වත් බව අන් දේශපාලනඥයන්ටද මාර්ගෝපදේශ සපයන්නක් විය. භෞතික සම්පත්වලට වඩා අධ්‍යාත්මික සුවය සෙවූ එතුමා ශ්‍රී ලාංකේය දේශපාලනයේ නිකැළැල් චරිතයක් ලෙස අවිවාදිතව හඳුන්වාදිය හැකිය.***

**හපුතලෙන් ලන්ඩන් වෙත..**

හපුතලේ ග්‍රාමයේ උපන් විජේසිංහ ජයවීර මුදියන්සේලාගේ ලොකුබණ්ඩාර හෙවත් ඔබ අප කවුරුත් දන්නා වි.ජ.මු. ලොකුබණ්ඩාර මැතිතුමා මුලින් යහළබැද්ද පාසලෙන්ද, අනතුරුව බණ්ඩාරවෙල මධ්‍ය මහා විද්‍යාලයෙන් ද, පාසල් අධ්‍යාපනය හදාළේය. පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ මානව ශාස්ත්‍ර අංශයේ උපාධිධාරියෙකු වූ හෙතෙම ලන්ඩන් විශ්වවිද්‍යාලයේ බාහිර උපාධිධාරියෙක් ද විය. ඔහු වෘත්තියෙන් නීතිඥවරයෙකි. එවක, ජනාධිපති ජේ.ආර්. ජයවර්ධනයන්ගේ ඇරයුමෙන් දේශපාලනයට පිවිසි ලොකුබණ්ඩාර මැතිතුමා කිසි කලෙක සිය සාහිත්‍ය කලා විෂයය හා වූ සබැඳියාව අමතක නොකළ සැබෑ භාෂා ප්‍රේමියෙකි.

**1977 වසරේදී පාර්ලිමේන්තුවට...**

1977 වසරේ දී, එක්සත් ජාතික පක්ෂය නියෝජනය කරමින් හපුතලේ ආසනයෙන් ප්‍රථම වරට පාර්ලිමේන්තුවට පිවිස, එම රජයේ කැබිනට් නොවන දේශීය වෛද්‍ය අමාත්‍යවරයා ලෙස කටයුතු කළ ඔහු, 1989 වසරේ දී අධ්‍යාපන, සංස්කෘතික හා ප්‍රවෘත්ති අමාත්‍යවරයා ලෙස ද, කටයුතු කළේය. 1990 වසරේදී සංස්කෘතික හා ප්‍රවෘත්ති අමාත්‍යවරයා ලෙස පත් හෙතෙම, 1993 වසරේ දී, අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යවරයා ලෙස ද, පත්විය. 1994 වසරේදී අධ්‍යාපන සහ සංස්කෘතික අමාත්‍යවරයා වූ අතර 2001 වසරේ සිට 2004 වසර දක්වා අධිකරණ, නීති ප්‍රතිසංස්කරණ සහ බුද්ධ ශාසන අමාත්‍යවරයා ලෙස ද, වි.ජ.මු. ලොකුබණ්ඩාර මැතිතුමා කටයුතු කර තිබේ.

සංස්කෘතිය අමාත්‍ය ධුරය හෙබවූ වි.ජ.මු. ලොකුබණ්ඩාර මැතිතුමා සිංහල බසින් ලියැවුණු එවක දුලබල පැරණි කෘතීන් ගණනාවක්ම, නැවත පළ කර දිවයින පුරා බෙදා හරින්නට කටයුතු සම්පාදනය කළේය.

කැබිනට් අමාත්‍ය ධුර දැරීම හෝ නොදැරීම පසෙක ලා, ගැමිකම ද, සරල බව ද, නිහතමානී බව ද, ඔහුගේ හුරුපුරුදු සිනහව තුළ නිබඳ, නොමඳව දක්නට ලැබිණි. වි.ජ.මු. ලොකුබණ්ඩාර මැතිතුමා දේශපාලඥයෙකු වුව, කවර අභියෝගයක් ඉදිරියේ වුව ද, සිය මුදුන් මුල අමතක නොකළ මිනිසෙකැයි කිවයුතු වන්නේ එබැවිනි.

**පාර්ලිමේන්තුවේ සොළොස්වන කථානායකවරයායි...**

නිදහසින් පසු මෙරට සොළොස්වන කථානායකවරයා ලෙස පත්වූ වි.ජ.මු.ලොකුබණ්ඩාර මැතිතුමා 2004-2010 දක්වා සිය ධුර කාලය තුළ අපක්ෂපාතීත්වය ආරක්ෂා කරගනිමින් කටයුතු කළේය. වි.ජ.මු. ලොකුබණ්ඩාර මැතිතුමාණන්ගේ තිස්තුන් වසරක (1977-2010) පාර්ලිමේන්තු දිවියේ කූඨප්‍රාප්තිය ලෙස වර්තමානයේ බොහෝ දෙනා

හඳුන්වන්නේ ඔහු කථානායක ධුරය දැරූ සමය වුවද, ඊට පූර්වයෙන්ද, ඔහු පාර්ලිමේන්තුවේ වැදගත් ධුර රැසක් හෙබවූ, මෙරට සිටි අත්දැකීම් බහුල දේශපාලඥයෙකු විය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව, ස්ථාවර නියෝග යනාදිය පිළිබඳව ඔහු සතු වූ දැනුම් සම්භාරයද, පාර්ලිමේන්තු කටයුතුවලට මනා පිටිවහලක්ම, වූ බැව් මෙහිදි වෙසෙසින්ම, සඳහන් කළ යුතුය.

පාර්ලිමේන්තුවේ මුලසුන හොබවන කථානායකවරයෙකුගේ කාර්යභාරය මැනවින් හඳුනාගෙන සිටි වි.ජ.මු. ලොකුබණ්ඩාර මැතිතුමා මෙන් පක්ෂ දේශපාලනය ඉක්මවා ගිය ස්වාධීන නිර්පාක්ෂිකයෙක් බව සිය හැසිරීමෙන්, පෙන්වා දුන්නේය. එතුමා කථානායකවරයා ලෙස කටයුතු කිරීමේ දී, නිතීඥයෙකු ලෙස ඔහු සතුව තිබුණු පරිචයද, භාෂාමය වශයෙන් සපුරා තිබූ දැනුම් සම්භාරයද, මනා ලෙස උපයෝගී කරගනු ලැබූ බව නොරහසකි.

බෞද්ධ දර්ශනය මත පිහිටා නිරතුරුව කටයුතු කිරීමට උත්සුක වූ, එතුමන්ගේ ආරාධනයෙන්, 2004 වසරේදී අනුරාධපුර ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේගේ ශාඛාවක් එවක, අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිතුමා විසින් පාර්ලිමේන්තුවේ සහ කථානායක නිල නිවසේ  රෝපණය කිරීමත්, එම වසරේදීම කථානායක නිල නිවසේදී බුදුමැදුරක් ස්ථාපිත කිරීමත් කැපී පෙනේ.

තවද සියලු ආගම් හා සංස්කෘතීන් පිළිබඳ මහත් ඇල්මක් හා ගෞරවයකින් කටයුතු කළ ලොකුබණ්ඩාර මහතා විවිධ ආගමික හා සංස්කෘතික උත්සව පාර්ලිමේන්තුව තුළ මෙන්ම, කථානායක නිල නිවසේදීද පැවැත්වීමට  උද්යෝගිමත්ව ක්‍රියා කළ ආකාරයද මෙහිදි සිහිපත් කළ යුතුමය.

**විපක්ෂයේ ප්‍රධාන සංවිධායක, ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක සහ සභානායක ධුරද හොබවයි...**
1994 දී විපක්ෂයේ ප්‍රධාන සංවිධායක ලෙසද, 2001 දී ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක සහ සභානායක ලෙසද, ව්‍යවස්ථාදායක ක්‍රියාවලිය තුළ, අතිශයින්ම ක්‍රියාශීලි මෙහෙවරක් ඉටු කිරීමට එතුමා සමත් විය. එසේම, අඛණ්ඩව තිස්තුන් වසරක් පාර්ලිමේන්තුව නියෝජනය කරමින්, විවිධ අමාත්‍ය ධුර දරමින් මහජන විශ්වාසය ආරක්ෂා කරගැනීමට සමත්වීම ද, පහසු කාරණයක් නොවන බව කිවමනාය.

**ශ්‍රේෂ්ඨ සාහිත්‍යධරයෙක්...**
බස  හැසිරවීමේ සිය නිපුණතාව  සබැඳිව, දසතින් අගැයුම් ලද ලොකුබණ්ඩාර මහතා සීගිරි ගී සිරි, රසදීපනි, ශාස්ත්‍රීය වාද ලිපි, The Mystic of  Sigiriya ආදි කෘති ගණනාවක කතුවරයාය.  එහෙයින්, සබරගමුව පළාත් සභාවේ ආණ්ඩුකාරධුරය හෙබැවූ වකවානුවෙහි පවා වි.ජ.මු. ලොකුබණ්ඩාර මහතා  සිය ලේඛනය නොනැවැත්වීය. එහෙයින්ම හෙළහවුලද, සිය සාමාජිකයෙකු වූ ඔහු අගයා, බස රැස දෙස නංවමින් කළ අනුපමේය සේවය වෙනුවෙන් පුදන ලද, “හෙළ බස් ඉසුරු” යන ගෞරව නාමයෙන්ද, වි.ජ.මු. ලොකුබණ්ඩාරසූරිහු පිදුම් ලදහ.








විශේෂාංග

# රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව සහ එහි කර්තව්‍ය



***පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග වලට අනුව, මහජන වියදම් සඳහා පාර්ලිමේන්තුව විසින් ප්‍රදානය කරනු ලබන මුදල් විසර්ජනය කිරීම පෙන්නුම් කරන ගිණුම්ද, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සුදුසු යැයි සලකනු ලැබිය හැකි පාර්ලිමේන්තුව ඉදිරියේ තබනු ලබන වෙනත් යම් ගිණුම්ද විගණකාධිපතිවරයාගේ සහාය ඇතිව පරීක්ෂා කරනු ලැබීම රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ කර්තව්‍ය වේ.***

මෙම කාරක සභාවේ ආරම්භය කෝල්බෲක් ආණ්ඩුක්‍රම අවදියේ අවසාන කාල පරිච්ඡේදය එනම් 1923 වර්ෂය දක්වා දිවයයි. 1921 ඔක්තෝම්බර් 06 වන ව්‍යවස්ථා සභාවට,  එවකට එහි සභික සාමාජිකයකු වූ දිවංගත ඊ.ආර්.තම්බිමුත්තු මහතා ඉදිරිපත් කළ යෝජනාවකට අනුව, බ්‍රිතාන්‍ය රජයේ එකඟතාවය ලැබීමෙන් පසු 1923 වර්ෂයේදී ස්ථාපනය කරන ලද අතර එහි මුල්ම රැස්වීම 1923 ඔක්තෝම්බර් 17 දින පවත් වන්නට යෙදුණි. මේ වන විට මෙම කාරක සභාව ආරම්භ කර වසර 98ක් ගතවී තිබේ.

1947 සෝල්බරි ව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලද මහජන නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේදී 1972 ජනරජ ව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලද පාර්ලිමේන්තුවේ, 1978 සම්මත කරන ලද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජ ව්‍යවස්ථාව යටතේ ද මහජන මුදල් පිළිබඳ පූර්ණ බලය පාර්ලිමේන්තුව සතු කෙරෙන ලද අතර,  එම ව්‍යවස්ථාවන් අනුව පිහිටුවන ලද පාර්ලිමේන්තු මඟින් සම්මත කර ගනු ලැබූ ස්ථාවර නියෝගයන් අනුව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව අනිවාර්ය අංගයක් වූවා මෙන්ම පාර්ලිමේන්තුව සතු මූල්‍ය බලතල ක්‍රියාත්මක වීම පිළිබඳව අධීක්ෂණය සඳහා යොදාගනු ලබන කාරක සභා අතර ප්‍රමුඛ හා නිත්‍ය කාරක සභාවක් බවට පත් විය. මෙම වැඩසටහන සාර්ථක ලෙස 2015, 2016, 2017, 2018 සහ 2019 යන මුදල් වර්ෂය දක්වා නොකඩවාම සිදු කළේය. මෙම වැඩපිළිවෙළ යටතේ රාජ්‍ය ආයතන 844ක් ඇගයීමට ලක්වන අතර, ඉන් තෝරාගත් ආයතන වෙත සම්මාන පුද කිරීමද සිදුවේ.

මෙම වැඩසටහන මඟින් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ මූල්‍ය අධීක්ෂණයට භාජනය විය යුතු හා රජයේ විගණකාධිපතිවරයා විසින් පාර්ලිමේන්තුවට විගණන වාර්තා ලබාදිය යුතු සමස්ත රාජ්‍ය,  පළාත් සභා හා පළාත් පාලන ආයතන ආවරණය වන පරිදි ඇගයුම් වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම, අනාගත නවීන තාක්ෂණය යොදාගනිමින් රාජ්‍ය මූල්‍ය පාලනයට අදාළ අධීක්ෂණ වැඩසටහනක් සඳහා පදනම සැකසීම, තිරසාර සංවර්ධනය, තොරතුරු දැනගැනීමේ පනත සහ පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම ඇගයීම වැනි කරුණු රැසක් අරමුණු කර ගෙන තිබේ. මෙම කාරක සභාව ආරම්භ කර වසර 96කට පසු එය ජනමාධ්‍යට විවෘත කිරීමටද 2019 වසරේදී කටයුතු කෙරිණ. එය මෙරට පාර්ලිමේන්තු ඉතිහාසයේ සංධිස්ථානයක් විය.

රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් ක්‍රියාත්මක කරනු ලබන රාජ්‍ය,  පළාත් සභා සහ පළාත් පාලන ආයතන ඇගයීමේ පරිගණක ජාලගත වැඩසටහන, ආයතනික ක්‍රමවේදයන් ප්‍රමිතිගත කිරීම සදහා මහඟු පිටිවහලක් වන බව කිවයුතු මනාය.

*මූලාශ්‍රය- ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව, (2018)-ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ.*

***එදිරිවීර ගුණසේකර,***
***මාධ්‍ය නිලධාරී,***
***සන්නිවේදන දෙපාර්තමේන්තුව.***

පුවත්

# ජනාධිපතිතුමා පස්වැනි වරටත් පාර්ලිමේන්තුවට

අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා පෙබරවාරි 11 වැනිදා පෙ.ව. 10.05ට පමණ පාර්ලිමේන්තුවට පැමිණ පැය දෙකක පමණ කාලයක් එහි රැඳී සිටියේය. එතුමා ජනාධිපති පදවියට පත්වීමෙන් පසු පාර්ලිමේන්තුවේ සභාගර්භයට පැමිණි පස්වන අවස්ථාව එය විය.



පාර්ලිමේන්තුවට පැමිණීමෙන් පසු ගරු අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතා සමඟ පාර්ලිමේන්තුවේ සභා ගර්භයට පිවිසි ඒ මහතා පෙරවරු 10.15 සිට 10.50 දක්වා විනාඩි 35 පමණ කාලයක් එහි අසුන් ගෙන සිටියේය. හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතාද ඒ වන විට සභාගර්භයේ අසුන් ගෙන සිටියේය.

සභා ගර්භයෙන් පිටව යාමෙන් පසු පාර්ලිමේන්තුවේ සිය කාර්යාලය වෙත ගිය ජනාධිපතිතුමා එහි පැයකට වැඩි කාලයක් රැඳී සිටි අතර, එහිදී ආණ්ඩු පක්ෂයේ ඇමතිවරුන් සහ පසුපෙළ මන්ත්‍රීවරයන් ගණනාවක් පැමිණ ඒ මහතා හමුවී සාකච්ඡා කර තිබේ.

# පාර්ලිමේන්තු මන්ත්‍රී වෛද්‍ය කාවින්ද ජයවර්ධන මහතා රජයේ මුදල් පිළිබඳ කාරක සභාවට

රජයේ මුදල් පිළිබඳ කාරක සභාවට සමඟි ජන බලවේගයේ පාර්ලිමේන්තු මන්ත්‍රී වෛද්‍ය කාවින්ද ජයවර්ධන මහතා පත් කෙරිණි.

එහි සාමාජිකයෙකු ලෙස කටයුතු කළ පාර්ලිමේන්තු, මන්ත්‍රී හේෂා විතානගේ මහතා එම කාරක සභාවෙන් ඉන් ඉල්ලා අස්වීම හේතුවෙන් මෙම නව පත් කිරීම සිදු කළ බව කථානායක මහින්ද යාපා අබේවර්ධන මහතා පසුගිය 09 වැනිදා පාර්ලිමේන්තුවේදී නිවේදනය කළේය.



# හිටපු කථානායක වි.ජ.මු ලොකුබණ්ඩාර මහතා රටට කළ සේවය විශිෂ්ටයි - අතිපූජ්‍ය ත්‍රිකුණාමලයේ ආනන්ද නාහිමිපාණෝ පවසති



***හිටපු කථානායක වි.ජ.මු. ලොකුබණ්ඩාර මහතා අමිල, විශිෂ්ට සහ ශ්‍රේෂ්ඨ සේවයක් රටට කළ බව බම්බලපිටිය ශ්‍රී වජිරාමාධිපති, අමරපුර ශ්‍රී ධර්මරක්ෂිත මහා නිකායේ මහානායක ධූරන්දර, අග්ග මහා පණ්ඩිත, අතිපූජ්‍ය ත්‍රිකුණාමලයේ ආනන්ද නාහිමිපාණෝ පවසති.***

වි.ජ.මු. ලොකුබණ්ඩාර මහතා ශ්‍රී ලාංකේය දේශපාලනයේ නොකැළැල් චරිතයක් බවත් නවක දේශපාලඥයන්ට එතුමාගේ චරිතයෙන් බොහෝ දේ ලබාගත හැකි බව මාහිමිපාණෝ මෙහිදී පෙන්වා දුන්හ.

දිවංගත හිටපු කථානායක වි.ජ.මු. ලොකුබණ්ඩාර මහතාගේ ගුණානුස්මරණය වෙනුවෙන් පාර්ලිමේන්තු පරිශ්‍රයේ උත්සව ශාලාවේ දී පසුගියදා පවත්වනු ලැබූ විශේෂ ධර්ම දේශනාමය පිංකමේදී උන්වහන්සේ මේ බව පැවසූහ.

ගරු කථානායක මහින්ද යාපා අබේවර්ධන මහතාගේ ප්‍රධානත්වයෙන් පැවැති මෙම පිංකමට වි.ජ.මු ලොකුබණ්ඩාර මහතාගේ පවුලේ සමීපතමයින්, සභානායක අමාත්‍ය දිනේෂ් ගුණවර්ධන, විරුද්ධ පාර්ශවයේ ප්‍රධාන සංවිධායක පාර්ලිමේන්තු මන්ත්‍රී ලක්ෂ්මන් කිරිඇල්ල යන මහත්වරුන්, අමාත්‍යවරුන්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් සහ පාර්ලිමේන්තුවේ මහ ලේකම් ධම්මික දසනායක මහතා ඇතුළු පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලය එක්ව සිටියහ.

ධර්මදේශනයට පෙරාතුව පාර්ලිමේන්තු පරිශ්‍රයේ ස්ථාපිත කර ඇති ජය ශ්‍රී මහා බෝධීන් වහසේගේ ශාඛාව ඉදිරිපිට දී වි.ජ.මු ලොකුබණ්ඩාර මහතාගේ පවුලේ සමීපතමයින්, කථානායකවරයා, අමාත්‍යවරුන්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් සහ පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලය එක්ව එතුමාට පිං පැමිණවීමේ කටයුත්තක් ද සිදු කෙරිණ.

පාර්ලිමේන්තුවේ බෞද්ධ සංගමය සහ පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලය එක්ව මෙම පිංකම සංවිධානය කළේය.



# සී.කලන්සූරිය මහතා පාර්ලිමේන්තුවේ අධ්‍යක්ෂ (පරිපාලන) තනතුරට



***සී. කලන්සූරිය මහතා ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ අධ්‍යක්ෂ (පරිපාලන) තනතුරට පත් කර තිබේ. එම තනතුරට පත්වන විට හෙතෙම නියෝජ්‍ය අධ්‍යක්ෂ (පරිපාලන) ලෙස කටයුතු කළේය.***

මතුගම ආනන්ද ශාස්ත්‍රාලයෙන් සහ ගාල්ල මහින්ද විද්‍යාලයෙන් අධ්‍යාපනය හදාරා ඇති සී. කලන්සූරිය මහතා 1983.04.04 දින පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලයට එක්විය.

පාර්ලිමේන්තුවේ පරිපාලන හා ව්‍යවස්ථාදායක දෙපාර්තමේන්තුවල වසර 38කට ආසන්න කාලයක් විවිධ තනතුරුවල සේවය කර තිබේ. ඕස්ට්‍රේලියාව, මැලේසියාව, සිංගප්පූරුව, ඉන්දියාව, ජපානය, මාලදිවයින සහ එක්සත් රාජධානිය වැනි රටවල පාර්ලිමේන්තුවල පුහුණු සැසිවලට ද ඔහු එක්ව තිබීම විශේෂත්වයකි.

# එච්. ඊ. ජනකාන්ත සිල්වා මහතා පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂ (පරිපාලන) තනතුරට



***එච්. ඊ. ජනකාන්ත සිල්වා මහතා ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂ (පරිපාලන) තනතුරට පත් කර තිබේ. ඔහු අවසන් වරට ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ ව්‍යවස්ථාදායක සේවා දෙපාර්තමේන්තුවේ සභාලේඛන කාර්යාංශයේ (Table Office) සහකාර අධ්‍යක්ෂවරයා ලෙස කටයුතු කළේය.***

1990 ජනවාරි මාසයේදී ලිපිකරුවෙකු ලෙස පාර්ලිමේන්තු සේවයට එක් වූ එච්. ඊ. ජනකාන්ත සිල්වා මහතා රෝමයේ උර්බානු විශ්ව විද්‍යාලයෙන් දර්ශනවාදය පිළිබඳ උපාධිය හිමිකරගෙන ඇත. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතිය (Constitutional Law) සහ පාර්ලිමේන්තු ක්‍රියාදාමයන් හා පරිචයන් පිළිබඳ ඩිප්ලෝමා දෙකක්ද, පාර්ලිමේන්තු ව්‍යවස්ථා සම්පාදනය (Legislative Drafting) පිළිබඳ විශේෂ නේවාසික පුහුණු පාඨමාලාවක්ද, පිළිවෙළින් ඉන්දියාවේ ICPS සහ BPST යන ආයතනවලින් ඔහු ලබාගෙන තිබේ.


ඊට අමතරව, ස්වීඩනය, චීනය, එංගලන්තය, කැනඩාව යනාදී රටවලදී විශේෂ වෘත්තීමය පුහුණු පාඨමාලාවලටද සහභාගී වී වසර 31ක පාර්ලිමේන්තු සේවා කාලයක් සම්පූර්ණ කර ඇති ජනකාන්ත සිල්වා මහතා ඉන් වසර 24ක කාලයක්ම ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ ව්‍යවස්ථාදායක සේවා දෙපාර්තමේන්තුවේ සේවය කර තිබීම විශේෂත්වයකි.

**විශේෂාංග**

# කථානායක නිල ඇඳුම













**වත්මන් පාර්ලිමේන්තු ක්‍රමය තුළ කථානායක පදවියට හිමි වන්නේ සුවිශේෂ ස්ථානයකි. කථානායක තනතුර සඳහා පාර්ලිමේන්තුව නියෝජනය කරන ඕනෑම මන්ත්‍රීවරයකුට පත් වීමට හැකිය. ඒ සභාවේ බහුතර කැමැත්තෙනි.**

මන්ත්‍රීවරයා කුමන දේශපාලන පසුබිමක් නියෝජනය කර පාර්ලිමේන්තුවට පිවිසියද එතුමන් කථානායක පදවියට පත්වූ පසු සභාවේ ස්වාධීන පුද්ගලයකු බවට පත්වේ. එසේම පාර්ලිමේන්තුව නියෝජනය කරන සෑම මන්ත්‍රීවරයකුගේ /මන්ත්‍රීවරියකුගේ අයිතිවාසිකම් හා වරප්‍රසාද වෙනුවෙන් පෙනී සිටින පුද්ගලයා බවට ඔහු පත් වේ.

එසේ පත්වන කථානායකතුමන් හට සභාවේ විශේෂ ආසනයක් පනවා තිබෙන අතර එතුමන්ට පමණක් සුවිශේෂී වූ නිල ඇඳුමක් ද වේ. මෙම නිල ඇඳුම ප්‍රධාන කොටස් හතරකින් සමන්විතය. කළු වර්ණයෙන් යුතු ඉතාමත් වටිනා, රෙදි වර්ගයකින් නිම කරවා ඇති මෙම ලෝගුව රන් පැහැති පටි අල්ලා රන්වන් පාට නූලෙන් හැඩ වැඩ කර ඇත. ප්‍රධාන ලෝගුවට ඇතුලෙන් අඳිනා දෙවන ලෝගුව සිනිඳු කළු පැහැති රෙද්දකින් නිමකර ඇත. මෙම නිල ඇඳුමේ ප්‍රධාන කොටස වන්නේ හිස් පළඳනාවයි. ඇත් දළ වර්ණයෙන් යුතු දුර්ලභ කෙඳි වර්ගයකින් රැළි සහිතව මෙම හිස්වැස්ම සකසා ඇත. නිල ඇඳුමේ තවත් කොටසක් වන්නේ ගෙල වටා බඳිනා කොලරයයි. සුදු පැහැයකින් යුතු කොලරය රේන්ද අල්ලා සරසා ඇත.

පොදු රාජ්‍ය මණ්ඩලයීය සම්ප්‍රදාය අනුගමනය කරන සෑම රටක්, කථානායකවරුන්ට මෙවන් නිල ඇඳුමක් හිමිය.නමුත් මෙහි විශේෂත්වය වන්නේ සම්ප්‍රදායක් වශයෙන් භාවිත කිරීම මිස සම්පූර්ණ නිල ඇඳුම ඇඳීම නීතියක් නොවීමයි. එපමණක් නොව කථානායකවරයාගේ පෞද්ගලික කැමැත්ත මත නිල ඇඳුම පැළඳීම, නොපැළඳීම හෝ එහෙයින් නිල් ඇඳුමේ යම් වෙනසක් කිරීමටද කථානායකවරයාට තීරණය කළ හැකිය.









***එස්. ජෙය ප්‍රකාශ්***
***මහජන සේවා සම්බන්ධීකාරක***
***සන්නිවේදන දෙපාර්තමේන්තුව***

පුවත්

# අපරාධ නීතිය, සිවිල් නීතිය සහ වාණිජ නීතිය ප්‍රතිසංස්කරණයට කමිටු 03ක්





ශ්‍රී ලංකාවේ දැනට පවතින අපරාධ නීතිය, සිවිල් නීතිය සහ වාණිජ නීතිය ප්‍රතිසංස්කරණයට අදාළ පූර්ණකාලීන අනු කමිටු 03ක් මේවන විට ක්‍රියාත්මක වන බවත් තවත් විශේෂඥ කමිටුවක් මඟින් නව ව්‍යවස්ථාව කෙටුම්පත් කරන බවත් අධිකරණ අමාත්‍ය අලි සබ්රි මහතා පාර්ලිමේන්තුවේදී පැවති අධිකරණ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේදී පැවසීය.

මේ අනුව, සමස්ත අධිකරණ පද්ධතියේම විශාල ප්‍රතිසංස්කරණයක් සිදු වෙමින් පවතින බව අමාත්‍යවරයා වැඩිදුරටත් සඳහන් කළේය.

කමිටුව අමතමින් පාර්ලිමේන්තුවේ සහකාර මහලේකම් සහ හිටපු මහේස්ත්‍රාත් අධිකරණ විනිසුරු ටිකිරි කේ. ජයතිලක මහතා කියා සිටියේ පුද්ගලයෙකු අපරාධකරුවකු ලෙස නම් කිරීම වෙනුවට වගකිව යුතු පුරවැසියෙකු ලෙස සමාජගත කිරීම සඳහා අපරාධ නීතිය සහ යුක්තිය පිළිබඳ සංකල්පය සමඟ බැඳී ඇති ප්‍රජා මූලික විශෝධනය වැදගත්වන බවයි.

මෙම පරමාර්ථය උපදේශක කමිටුවට ස්තර දෙකක් හරහා කළ හැකි බව සහකාර මහලේකම්වරයා පෙන්වා දුන්නේය. පළමුවැන්න අවශ්‍ය ප්‍රතිසංස්කරණ සඳහා පෙළඹවීම සඳහා දේශපාලන නායකත්වය ඇතුළත් දේශපාලන ස්ථරය බවත් දෙවන ස්තරයට විවිධ ක්ෂේත්‍ර නියෝජනය කරන නිලධාරීන් සහ වෘත්තිකයන් ඇතුළත් වන අතර අදාළ ප්‍රතිසංස්කරණ සඳහා ඔවුන්ගේ විශේෂඥ දැනුම ලබාගත හැකි බවත් ඔහු වැඩිදුරටත් පෙන්වා දුන්නේය.

මෙහිදී අධිකරණ අමාත්‍යවරයා ප්‍රකාශ කළේ, වඩාත් අර්ථාන්විත ප්‍රතිඵලයක් උදෙසා තීරණ ගැනීමේ ක්‍රියාවලියට දායක වීමට කැමති සියලු දෙනා සම්බන්ධ කර ගැනීම අමාත්‍යාංශයේ අරමුණ බවයි.

බන්ධනාගාරවල රැඳවුවන් සඳහා ධාරිතාව 11,000ක් පමණ වුවද කොවිඩ් වසංගතය ඇතිවීමට පෙර සහ සාමාන්‍ය තත්ත්වයන් යටතේ දළ වශයෙන් 30,000 - 33,000 අතර සංඛ්‍යාවක් දක්වා බන්ධනාගාරවල සිටි බවත් බහුතරය රිමාන්ඩ් සිරකරුවන් පමණක් වන අතර, ඔවුන්ගෙන් වැරදිකරුවන් වන්නේ ආසන්න වශයෙන් 8000ක් පමණක් බවත් අමාත්‍යවරයා පැවසීය.

එසේම, රිමාන්ඩ් බන්ධනාගාරයේ සිටින 90%ක් හෝ ඊට වැඩි පිරිසක් මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වූවන් මිස මත්ද්‍රව්‍යවලට සම්බන්ධ අපරාධකරුවන් නොවන බවත් ඔහු තව දුරටත් පෙන්වා දුන්නේය.

වැලිකඩ බන්ධනාගාරය හොරණ ප්‍රදේශයට ගෙන යාම සඳහා නාගරික සංවර්ධන අධිකාරිය විසින් අක්කර 250ක් ලබා දී ඇති බව පැවසූ බන්ධනාගාර කළමණාකරණ හා සිරකරුවන් පුනරුත්ථාපනය පිළිබඳ රාජ්‍ය අමාත්‍ය ලොහාන් රත්වත්තේ මහතා මෙහිදී සඳහන් කළේද එය වැලිකඩ ඇති භූමි ප්‍රමාණය වන අක්කර 38 මෙන් දහ ගුණයකින් විශාල භූමියක් බවයි.

මෙම රැස්වීමට රාජ්‍ය අමාත්‍ය සුසිල් ප්‍රේමජයන්ත, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් වන නීතිඥ සාගර කාරියවසම්, උදයන කිරිඳිගොඩ, මධුර විතානගේ, ජී.ජී.පොන්ම්බලම්, චාර්ල්ස් නිර්මලනාදන් යන මන්ත්‍රීවරුද එක්ව සිටියහ.

විශේෂාංග

# ඇමරිකානු උප ජනාධිපතිනි කමලා හැරිස්



පසුගියදා පැවති ඇමරිකානු ජනාධිපතිවරණයෙන් ජෝ බයිඩන් ජයග්‍රහණය කිරීමත් සමගම ඔහුගේ උප ජනාධිපති ධුරයට කමලා හැරිස් පත්වුණේ ඇමරිකානු දේශපාලන ඉතිහාසයේ උප ජනාධිපති ධුරයට පත් පළමු කාන්තාව ලෙසිනි.

වර්ෂ 1964 ඔක්තෝබර් 20 වන දින කැලිෆෝනියාවේ ඕක්ලන්ඩ් ජනපදයෙහි ඉන්දියානු ජාතික ශ්‍යාමලා ගෝපාලන් හා ජැමෙයිකානු ජාතික ඩොනල්ඩ් හැරිස් දාව උපන් කමලා හැරිස් කුඩා කල සිට හැදී වැඩුණේ ඉහළ අධ්‍යාපනයක් සහිත පවුල් පරිසරයක් තුළයි. සත් වයසැති කුඩා හැරිස් හට මුහුණ දෙන්නට සිදු වූ දෙමාපියන්ගේ වෙන්වීම ජීවිතයේ එක් දෛවෝපගත කඩඉමක් විය.

ඉන්දීය - ජැමෙයිකන් සම්භවයක් සහිත කාන්තාවක් වූ ඇයට කලු සමක් උරුම වූයෙන් කුඩා කල නොයෙක් අභියෝගයන්ට මුහුණ දීමට සිදු වූ අතර "සමේ පැහැය හෝ සම්භවය තම දේශපාලන මතය නිර්භයව ඉදිරිපත් කිරීමට කිසිදු බාධාවක් නොවුණ බව වරෙක ඇය 'වොෂිංටන් පෝස්ට්' වෙත පවසා තිබුණේ තමා සැබෑ ඇමරිකානුවෙක් බව ලොවට සපථ කරමිනි. කුඩාවියේ තමා ලද අභියෝගයන් ශක්තියක් කරගත් හැරිස් උසස් අධ්‍යාපනය සඳහා 1986 වර්ෂයේදී හාවර්ඩ් විශ්වවිද්‍යාලයට පිවිසෙන්නේ අනාගතය පිළිබඳ සුබ සිහින ගොන්නක් පොදිබැඳ ගනිමිනි. දේශපාලන විද්‍යාව සහ ආර්ථික විද්‍යාව පිළිබඳ ප්‍රථම උපාධියක් ලබා ගත් ඇය සිව් වසරක විශ්ව විද්‍යාල දිවියට සමු දී 1989 වර්ෂයේදී කැලිෆෝනියා විශ්වවිද්‍යාලයට ඇතුළත්ව නීති උපාධියක් ලබා ගන්නේ තම වෘත්තීය ජීවිතයට මෙන්ම දේශපාලන දිවියටද මුල පිරීමක් වශයෙනි.

එම විශ්වවිද්‍යාලයේ "Black Law Student Society" හෙවත් කලු ශිෂ්‍ය සංගමයේ සභාපති ලෙස කටයුතු කල හැරිස් සිසුන් අතර කැපී පෙනෙන චරිතයක් විය. උසස් අධ්‍යාපන කටයුතු හමාරව ඇලමෙඩා දිස්ත්‍රික්කයේ නීතිපති කාර්යාලයේ තම වෘත්තීය ජීවිතය අරඹන ඇය අනතුරුව ඕක්ලන්ඩ්හි නියෝජ්‍ය නීතිපති වශයෙන්ද කටයුතු කල කාල වකවානුවද සුවිශේෂී විය. කැරලි මර්දනය, මත්ද්‍රව්‍ය උවදුර මෙන්ම ලිංගික අපයෝජන ක්‍රියාවන් හමුවේ ඇය තදින් නීතිය ක්‍රියාත්මක කළ ආකාරය නිසා ඇය වඩාත්





ජනාදරයට පාත්‍ර වූවාය. කමලා හැරිස් 2003 වර්ෂයේදී ෆ්‍රැන්සිස්කෝහි දිස්ත්‍රික් නීතිපති ධුරයට පත් වූ අතර එම තනතුර ඇගේ වෘත්තීය ජීවිතයේ වෙනස්කම් රැසකට තුඩු දෙන්නක් විය.

රටේ සියලු ජන කොටස්වල අයිතිවාසිකම්, නිදහස හා ආර්ථික සාධාරණත්වය වෙනුවෙන් සටන් කල ඇය අඩු ආදායම්ලාභී සුළු ජාතික පවුල්වල සිටින දරුවන්හට විධිමත් අධ්‍යාපනයක් ලබා දිය යුතුයි යන්න මෙන්ම බදු පැන්වීමේදී කිසියම් පාලනයක් පැවතිය යුතුයි යන ස්ථාවරත්වයෙන් කටයුතු කර ඇය එකිනෙකා වෙනුවෙන් සංවේදී වීම මනුෂ්‍යත්වයේ උපරිමය ලෝකයාට පෙන්වූ අවස්ථාවක් විය.

ඇමරිකානු පුරවැසිභාවය සම්බන්ධයෙන් ජනතාවට ගැටලු පැන නගින අවස්ථාවන්හිදී ඒ දෙස සානුකම්පිතව කටයුතු කළ ආකාරයද ප්‍රශංසනීය වේ. එමෙන්ම ගිනි අවි ලඟ තබා ගැනීමේ පාලනයක් තිබිය යුතු බවටද හඬක් නැගූ ඇය ගිනි අවි ළඟ තබා




ගැනීමෙන් සමාජයට විය හැකි හානිය පෙන්වා දීමට කල නිරන්තර අරගලයද ප්‍රශංසනීය වේ.

ඩිමොක්‍රටික් පාක්ෂිකයෙකු වන ඇය ඇමරිකානු ජනතාව වෙනුවෙන් අවධි කල හඬ නිසාවෙන් දිනෙන් දින කැපී පෙනෙන්නට වූ අතර 2016 වසරේදී කැලිෆෝනියාවේ සෙනෙට් සභික ධූරයට පත්වූ දෙවන කලු ජාතික සෙනට් සභික කාන්තාව වූවා සේම ප්‍රථම ආසියාතික සම්භවයක් සහිත කාන්තාව බවටද පත් වූවාය. පසුගියදා පැවති ඇමරිකානු ජනාධිපතිවරණයේ ජෝ බයිඩන්ගේ ජයග්‍රහණයත් සමගම උප ජනාධිපති ධූරයට කමලා හැරිස් පත්වන්නේ අනාගත දේශපාලනයේ කාන්තා බල පරාක්‍රමය පිළිබඳව යම් ඉඟියක් ලෝවැස්සන්ගේ සිත්හි නංවමිනි. ඇගේ දැක්ම විශ්වාස කළ ඇමරිකානුවන් මෙන්ම ලෝක බලවතා වූ ජෝ බයිඩන් සමඟ එක්ව ඇමරිකාව නව මාවතකට රැගෙන යන ආකාරය පිළිබඳ සියල්ලගේම අවධානය යොමුව ඇති අතර ඇමරිකානු ජනතාව වෙනුවෙන් හඬ නගා ජීවිත සුබිත කිරීමේ කර්තව්‍ය දැන් ඇගේ දෙඋර මත පැටවී ඇත.

***නිපුනි බලගමගේ***
***මහජන සේවා නිලධාරී***
***සන්නිවේදන දෙපාර්තමේන්තුව***

**පුවත්**

# අමාත්‍යාංශ ලේකම්වරුන් සිවු දෙනෙකුට සහ තානාපතිවරුන් දෙදෙනෙකුට පාර්ලිමේන්තුවේ උසස් නිලතල පිළිබඳ කාරක සභාවේ අනුමැතිය


රජයේ අමාත්‍යාංශ 04ක ලේකම්වරුන්ගේ සහ නයිජීරියානු ෆෙඩරල් ජනරජයේ සහ සිෂෙල්ස් රාජ්‍යයේ නව ශ්‍රී ලංකා තානාපතිවරුන්ගේ පත්වීම් පාර්ලිමේන්තුවේ උසස් නිලතල පිළිබඳ කාරක සභාව විසින් අනුමත කරනු ලැබූ බව පාර්ලිමේන්තුවේ මහ ලේකම් ධම්මික දසනායක මහතා පැවසීය.

කටානායක මහින්ද යාපා අබේවර්ධන මහතාගේ ප්‍රධානත්වයෙන් පැවති මෙම කාරක සභාවේ රැස්වීමට සභානායක දිනේෂ් ගුණවර්ධන, ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක ජොන්ස්ටන් ප්‍රනාන්දු, අමාත්‍යවරුන් වන චමල් රාජපක්ෂ, නිමල් සිරිපාල ද සිල්වා, උදය ගම්මන්පිල, වෛද්‍ය සුදර්ශනී ප්‍රනාන්දුපුල්ලේ, විදුර වික්‍රමනායක සහ මන්ත්‍රීවරුන් වන ජෝන් සෙනවිරත්න, අනුර ප්‍රියදර්ශන යාපා සහ රිෂාඩ් බදියුදීන් යන මහත්වරු න් ද සහභාගී වූහ.

එහිදී නයිජීරියානු ෆෙඩරල් ජනරජයේ ශ්‍රී ලංකා තානාපතිවරයා ලෙස ජේ. එම්. ජේ. පී. බණ්ඩාර මහතාගේ සහ සීෂේල්ස් රාජ්‍යයේ නව ශ්‍රී ලංකා තානාපතිවරයා ලෙස ශ්‍රීමාල් වික්‍රමසිංහ මහතාගේ නම් මෙහිදී අනුමැතියට ලක් වී තිබේ.

මෙයට අමතරව කම්කරු අමාත්‍යාංශයේ ලේකම්වරයා ලෙස මාපා පතිරණ මහතාගේ, ධීවර අමාත්‍යාංශයේ ලේකම්වරිය ලෙස ආර්. එම්. අයි. රත්නායක මහත්මියගේ, ක්‍රීඩා හා තරුණ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්වරයා ලෙස අනුරාධ විජේකෝන් මහතාගේ සහ සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්වරයා ලෙස මේජර් ජනරාල් සංජීව මුණසිංහ මහතාගේ නම්ද මෙහිදී අනුමත කර ඇත.

# කොවිඩ් -19 එන්නත්කරණ ක්‍රියාදාමය මිත්‍යාවෙන් ඔබ්බට




***2019 දෙසැම්බර් 31 වන දින චීනයේ ලෝක සෞඛ්‍ය සංවිධානයේ කාර්යාලය වෙත ව්‍යාකූල ස්වභාවයකින් යුත් තොරතුරක් වාර්තා විය. එනම්, චීනයේ වුහාන් ප්‍රදේශය තුළ නිශ්චිත කර ගත නොහැකි හේතූන් මත නියුමෝනියා තත්ත්වයක් උද්ගතව වී තිබෙන බවයි.***




මේ පිළිබඳ සොයා බැලීමෙන් අනතුරුව අදාළ බලධාරීන් විසින් නව කොරෝනා වෛරස කාණ්ඩයක් හඳුනා ගන්නා ලද අතර පසුව එය කෝවිඩ් - 19 ලෙස නම් කරන ලදී. ඒ අනුව 2020 ජනවාරි 30 වන දින ලෝක සෞඛ්‍ය සංවිධානයේ අධ්‍යක්ෂ ජෙනරාල්තුමන් විසින් කෝවිඩ් -19 වෛරසයේ පැතිර යාමත් සමඟ ජාත්‍යන්තර අවධානයට ලක්වන මහජන සෞඛ්‍ය හදිසි අවස්ථාවක් (PHEIC) ප්‍රකාශයට පත් කළ අතර 2020 මාර්තු 11 වන දින කෝවිඩ් - 19 ගෝලීය වසංගත තත්ත්වයක් ලෙස ප්‍රකාශයට පත් කරන ලදී.

වෛරසය හඳුනා ගැනීම හා ව්‍යාප්තිය සමඟ වසරකට ආසන්න කාලයක් සාමාන්‍ය ජීවන රටාවන්හි අඩපණ වීම්, දැඩි ගෝලීය ආර්ථිකමය පසුබෑම් ඇතුළු මහත් අභියෝගකාරී කාල පරිච්ඡේදයක් පසු කරමින් සිටි ලොවක් හමුවේ මේ වන විට කොවිඩ් මර්දන එන්නත් වර්ග කිහිපයක් හඳුන්වා දී තිබේ.

ඒ අනුව 2021 ජනවාරි 20 වන දින වන විට කෝවිඩ්-19 එන්නත් හයක් තුන්වන අත්හදා බැලීමේ අදියර අවසන් කර ලෝක සෞඛ්‍ය සංවිධානය වෙත සඵලතාව වාර්තා කර තිබිණ. තුන්වන අදියරය අවසන් කර එසේ වාර්තා ලබා දුන් එන්නත් වන්නේ Pfizer-BioNTech COVID-19 එන්නත, Moderna එන්නත, Oxford$AstraZeneca COVID-19 එන්නත, Sputnik V එන්නත, Sinopharm එන්නත සහ Sinovac යන එන්නතය.

ලෝක සංවිධානයට අනුව විද්‍යාර්ථීන් විසින් ඒවායේ සඵලතා ප්‍රතිඵල විධිමත් ලෙස සමාලෝචනයට ලක් කර තිබෙන්නේ මේ වන විට එන්නත් නිෂ්පාදන දෙකක පමණි. ඒ අනුව Lancet වෛද්‍ය ප්‍රකාශනය විසින් Oxford AstraZeneca COVID-19 එන්නත ද, New England Journal of Medicine විසින් Pfizer-BioNTech COVID-19 එන්නත ද සමාලෝචනය කර ඇත.

ලොව පුරා රටවල් ගණනාවක් මේ වන විටත් එන්නත් කිරීමේ වැඩසටහන් ආරම්භ කර තිබෙන අතර, එංගලන්තයේ ඔක්ස්ෆර්ඩ් විශ්වවිද්‍යාලය සහ AstraZenecea සමාගම මඟින් නිර්මාණය කර ඉන්දියාව තුළ නිෂ්පාදනය කරනු ලබන Oxford-Astrazeneca එන්නත මේ වන විටත් ශ්‍රී ලංකාවාසි ජනතාව වෙත ලබා දීමේ වැඩපිළිවෙල ක්‍රියාත්මක වෙමින් පවතී. ඒ අනුව මෙම නිර්දේශිත කෝවිඩ්-19 එන්නත පිළිබඳ නිවැරදි තොරතුරු දැන සිටීම ඉතා වැදගත් වන අතර කටකතා සහ වැරදි තොරතුරු සම්ප්‍රේෂණය මඟින් උද්ගතව තිබෙන තත්ත්වයට පිළියම් සෙවිය නොහැකිය. නිරෝගීව සිටීම සඳහා පුද්ගලයන් සවිබල ගන්වන උසස් තත්ත්වයේ, වලංගු, තොරතුරු ප්‍රභවයන් සෙවීමට අප සෑම කෙනෙකුටම වගකීමක් ඇත. ඒ අනුව මෙම එන්නත ලබා ගත යුතුද යන්න තීරණය කිරීමේදී, සෑම විටකම මිථ්‍යා මතයන්ගෙන් නිවැරදි විද්‍යාත්මකව තහවුරු වූ කරුණු වෙන් කර හඳුනා ගැනීම වැදගත්ය.

“කෝවිඩ්-19 එන්නත මඟින් කාන්තාවන් හට දරුඵල අහිමි වේ”. එන්නත ලබා ගැනීම වඳභාවයට හේතු වන බවට කිසිඳු සාක්ෂියක් නොමැති අතර අනාගතයේදී

ගැබ් ගැනීමට අපේක්ෂාවෙන් සිටින පුද්ගලයන් හටද කෝවිඩ්-19 එන්නත ලබා ගත හැකිය. "මෙම එන්නත මඟින් කොවිඩ් වෛරසය ශරීරගත කරනු ලබයි". එන්නත තුළ එලෙස සජීවී වෛරසයක් අඩංගු කර නොමැති බැවින් එලෙස ආසාදනය වීමක් සිදු නොවේ. එන්නත් කිරීමෙන් අනතුරුව හිසරදයක් හෝ සෙම්ප්‍රතිශ්‍යාවක් වැනි අතුරු ආබාධ ඇතිවිය හැකි අතර එයට හේතුව වන්නේ අපගේ ශරීරය ප්‍රතිශක්තිකරණ ප්‍රතිචාරයක් නිර්මාණය කිරීමකි. එය කිසි ලෙසකින් හෝ ආසාදන තත්ත්වයක් නොවේ.

"කෝවිඩ්-19 වැළඳී පසුව සුව වූ පුද්ගලයන් එන්නත ලබා ගත යුතු නැත" මේ වන විටත් කෝවිඩ්-19 වැළඳී සුව වූ පුද්ගලයෙකු වුවද, එන්නත ලබා ගැනීම මඟින් ප්‍රතිලාභ තිබෙන බවට සාක්ෂි තිබේ. කෝවිඩ්-19 තත්ත්වයෙන් සුවය ලැබුවෙකු නැවත අසනීප වීමෙන් ආරක්ෂා වන්නේ කෙසේදැයි විශේෂඥයින් තවමත් නොදනී. එසේම, ආසාදනයකින් යමෙකු ලබා ගන්නා ස්වාභාවික ප්‍රතිශක්තිය පුද්ගලයාගෙන් පුද්ගලයාට වෙනස් වන අතර එම ස්වාභාවික ප්‍රතිශක්තීකරණය කෙතරම් දුරකට පුද්ගලයෙකු ආරක්ෂා කරනු ලබයිද යන්නටද තවමත් ප්‍රමාණවත් සාක්ෂි නොමැත. එබැවින් වෛරසය ආසාදනය වී සුවවීම එන්නත ලබා ගැනීම මඟ හැරීමට හේතු සාධකයක් කර ගත යුතු නැත.

"එන්නත ලබා ගත් පසු, ආරක්ෂක පියවර අනුගමනය කිරීම අවශ්‍ය නොවේ". මුඛ ආවරණ පැළඳීම, අත් සේදීම සහ සමාජ දුරස්ථභාවය රැක ගැනීම සිදු කිරීම සමස්ත ප්‍රජාවෙන් සැලකිය යුතු ප්‍රමාණයක් එන්නත්කරණයට ලක් කරන තෙක් අඛණ්ඩව සිදු කිරීම අවශ්‍ය වේ.

"මෙම COVID-19 එන්නත මෙතරම් ඉක්මනින් ලබා දීම හේතුවෙන් එය නිසි අත්හදා බැලීමේ අදියරයන් පසු කර නොමැත. එබැවින් එහි ගුණාත්මක හා ආරක්ෂිතභාවය ගැටලුසහගත වේ".

එන්නත් වල ගුණාත්මක හා ආරක්ෂිතභාවය පිලිබඳ තහවුරු කිරීම ලෝක සෞඛ්‍ය සංවිධානයේ ප්‍රමුඛතාවයකි. දැනට භාවිත කරන COVID-19 එන්නත්වල ගුණාත්මක හා ආරක්ෂිතභාවය බව සහතික කිරීම සඳහා සියලු අවශ්‍ය පියවරයන් අනුගමනය කොට අධ්‍යයනයන් සිදු කර ඇත.

***මාධවී රංගේබණ්ඩාර***
***මාධ්‍ය නිලධාරී***
***සන්නිවේදන දෙපාර්තමේන්තුව***



## කර්තෘ මණ්ඩලය

*උපදේශනය*

ධම්මික දසනායක මහතා (පාර්ලිමේන්තු මහලේකම්)
කුෂාණි රෝහණධීර මහත්මිය (නියෝජ්‍ය මහලේකම් හා කාර්ය මණ්ඩලය ප්‍රධානී)
ටිකිරි කේ. ජයතිලක මහතා (සහකාර මහලේකම්)

*සංකල්පය හා මඟපෙන්වීම*

ශාන් විජේතුංග මහතා

*ප්‍රධාන සංස්කරණය*

බුද්ධිනි රාමනායක මෙනෙවිය
එදිරිවීර ගුණසේකර මහතා
නිම්මි හාතියල්දේණිය මහත්මිය

*ඡායාරූපකරණය*

නුවන් දුමින්ද මහතා

*පිටු සැලසුම්කරණය*

ඉෂාරා වික්‍රමසිංහ මෙනෙවිය

*අන්තර්ජාලය හරහා බෙදාහැරීම*

වී.ජී.එම්.එම්.නුස්කි මහතා

# නිලධර වින්ති



**ඉන්දිරා දිසානායක මහත්මිය**
සහකාර අධ්‍යක්ෂ (පරිපාලන)
කාරක සභා කාර්යාංශය

බම්බලපිටිය ලින්ඩ්සේ බාලිකා විද්‍යාලයෙන් සහ කොළඹ ගෝතමී බාලිකා විද්‍යාලයෙන් මූලික අධ්‍යාපනය ලැබූ ඉන්දිරා දිසානායක මහත්මිය පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ විද්‍යාවේදී උපාධිධාරිණියකි. ඇය 1991 වසරේදී පාර්ලිමේන්තු නිලධාරිනියක ලෙස පාර්ලිමේන්තු සේවයට එක්වන්නීය.

මුදල් හා ගිණුම් කාර්යංශය, එවකට පොදු ව්‍යාපාර සහ රජයේ ගිණුම් පිළිබඳ කාර්යංශය, ආයතන කාර්යංශය, සභාලේඛන කාර්යංශය, එවකට උපදේශක කාරක සභා කාර්යංශය වැනි කාර්යංශ රැසක ඇය සේවය කර තිබේ.

වර්තමානය වන විට ඉන්දිරා දිසානායක මිය ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ කාරක සභා කාර්යාංශයේ සහකාර අධ්‍යක්ෂ (පරිපාලන) ලෙස කටයුතු කරමින් සිටින්නීය.

පරිපාලනය සහ කළමණාකරණය පිළිබඳ විවිධ දේශීය ආයතන මගින් පුහුණුව ලබා ඇති ඇය ඉන්දියානු ලෝක සභාවට අනුබද්ධ Bureau of Parliamentary Studies and Training ආයතනයෙන් පාර්ලිමේන්තු කාර්ය පටිපාටිය සහ පරිචය පිළිබඳවද පශ්චාත් පාලනය ඇතුලු විශේෂ පුහුණු වැඩසටහන් සඳහා සහභාගී වී ඇත.

මීට අමතරව ඇය එංගලන්තයේ සහ චීනයේ දී පුහුණු වැඩසටහන් වලට සහභාගී වී ඇත.



**සේනක කුළුගම්මන මහතා**
සහකාර අධ්‍යක්ෂ (පරිපාලන)
මහජන පෙත්සම් කාරක සභාව

කුළුගම්මන ශ්‍රී ප්‍රේමරතන මහා විද්‍යාලයෙන්ද මහනුවර සාන්ත සිල්වෙස්තර විද්‍යාලයෙන් ද මූලික අධ්‍යාපනය ලැබූ සේනක කුළුගම්මන මහතා ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයෙන් ජීව විද්‍යා අංශයෙන් විද්‍යාවේදී උපාධිය හිමිකරගෙන තිබේ.

ගුරු වෘත්තියෙන් රාජ්‍ය සේවයට පිවිසුණු හෙතෙම 1992.11.23 දින ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවට සම්බන්ධ විය. එවකට පොදු රාජ්‍ය මණ්ඩලයීය පාර්ලිමේන්තු සහ අන්තර් පාර්ලිමේන්තු සංගම් කාර්යාංශයෙහි, කාරක සභා කාර්යාංශයෙහිද, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභා කාර්යාලයෙහිද, සභා ලේඛන කාර්යාංශයෙහිද, පනත් කෙටුම්පත් කාරයාංශයෙහිද, අභ්‍යන්තර විගණන කාර්යාංශයෙහිද, ප්‍රවාහන කාර්යාංශයෙහිද සේනක මහතා සේවය කර ඇත.

1998 වසරේදී ජ්‍යෙෂ්ඨ නිලධාරී, 2003 වසරේදී නියෝජ්‍ය ප්‍රධාන නිලධාරී, 2007 වසරේදී ප්‍රධාන නිලධාරී සහ 2014 වසරේදී සහකාර අධ්‍යක්ෂ වශයෙන්ද හෙතෙම උසස්වීම් ලබා තිබේ.

වරප්‍රසාද කාරක සභාව, ස්ථාවර නියෝග කාරක සභාව, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව සහ විශේෂ කාරක සභාවන්වලද කටයුතු කිරීමට ඔහු සමත්ව ඇත.
තවද අභ්‍යන්තර විගණන කාර්යාංශයේ සහකාර අධ්‍යක්ෂ වශයෙන් සේවය කරමින් සිටි අවධියේදී, පාර්ලිමේන්තුව සතු ඉඩම් සඳහා විධිමත් පැවරීමේ සහතික පාර්ලිමේන්තුව වෙත ලබා ගැනීම සඳහා පත් කළ කමිටුවෙහි ලේකම් වශයෙන් කටයුතු කරමින් එම කටයුත්ත ඉටු කරගැනීමට හැකිවීම පාර්ලිමේන්තුව වෙනුවෙන් ඔහු සැපයූ සුවිශේෂී දායකත්වයකි.



**අනුෂා සී.පී. සූරියප්පෙරුම මහත්මිය**
සහකාර අධ්‍යක්ෂ (පරිපාලන)
රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව

කළුතර ශුද්ධ වූ පවුලේ කන්‍යාරාමයෙන් මූලික අධ්‍යාපනය ලැබූ අනුෂා සූරියප්පෙරුම මහත්මිය කොළඹ විශ්වවිද්‍යාලයේ වාණිජවේදී විශේෂ උපාධිධාරිනියකි.

1992 වසරේදී පාර්ලිමේන්තු සේවයට එක්වන ඇය මන්ත්‍රීසේවා කාර්යංශය, පනත් කෙටුම්පත් කාර්යංශය, මුදල් කාර්යංශය යන අංශවල සේවය කර තිබේ.

ව්‍යවස්ථාදායක කටයුතු පිළිබඳව එංගලන්තයේ ලන්ඩන් නුවර පැවැති 64 වන වෙස්ට්මින්ස්ට සමුළුවට මෙන්ම දේශීය හා විදේශීය පුහුණු වැඩසටහන් සඳහා ද ඇය සහභාගී වූවාය.

අනුෂා සූරියප්පෙරුම මහත්මිය වර්තමානයේදී ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සහකාර අධ්‍යක්ෂ පරිපාලන තනතුරේ කටයුතු කරන්නීය. පාර්ලිමේන්තුවේ මහලේකම්වරයා වෙනුවෙන් එම කාරක සභාවේ ලේකම්වරිය ලෙසද සූරියප්පෙරුම මහත්මිය සේවය කරන්නීය.

# පාර්ලිමේන්තු සාර සංහිතා ශාස්ත්‍රීය සංග්‍රහය සඳහා ලිපි කැඳවීම



පාර්ලිමේන්තු මහලේකම්තුමාගේ කාර්ය මණ්ඩලය යටතේ ක්‍රියාත්මක සන්නිවේදන දෙපාර්තමේන්තුව විසින් 'පාර්ලිමේන්තු සාර සංහිතා' නමින් ශාස්ත්‍රීය ග්‍රන්ථයක් සම්පාදනය කරනු ලබයි. එහි දෙවන කලාපය සඳහා ලිපි කැඳවීම ආරම්භ කර ඇත.

<u>පහත තේමා යටතේ ලිපි සම්පාදනය කළ හැකිය.</u>

- ශ්‍රී ලාංකේය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සහ ව්‍යවස්ථා සංශෝධන
- නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදය සහ කමිටු ක්‍රමය
- පාර්ලිමේන්තුවේ ව්‍යවස්ථාදායක කාර්යය
- ශ්‍රී ලාංකේය පාර්ලිමේන්තුව සහ පුරවැසි දායකත්වය
- පාර්ලිමේන්තු ස්ථාවර නියෝග, මන්ත්‍රී චර්යාධර්ම සහ ක්‍රියාපටිපාටි
- ශ්‍රී ලාංකේය මැතිවරණ ක්‍රමය
- ශ්‍රී ලාංකේය පාර්ලිමේන්තුව සහ මහජන සම්බන්ධතා
- පාර්ලිමේන්තු වාර්තාකරණය හා ජන මාධ්‍ය
- තිරසර සංවර්ධන ඉලක්ක සහ පාර්ලිමේන්තු ක්‍රමය
- ශ්‍රී ලාංකේය කාන්තා දේශපාලනයේ නව ප්‍රවණතා
- පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුගේ කාර්යභාරය සහ ජනතා අභිලාෂ

ඉහත තේමා යටතේ සම්පාදනය කරන ලිපි වචන 3500 - 5000 අතර විය යුතුය.

## මාර්ගෝපදේශ

1) සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂාවන්ගෙන් ලිපි සම්පාදනය කළ හැකිය.
2) සිංහල ලිපි සඳහා FM Abhaya, ඉංග්‍රීසි ලිපි සඳහා Times New Roman , දෙමළ ලිපි සඳහා Bamini අක්ෂර භාවිත කළ යුතුය.
3) අකුරු ප්‍රමාණය - සිංහල හා දෙමළ පොයින්ට් 12 - ඉංග්‍රීසි පොයින්ට් 11
4) පේළි අතර 1.5 පරතරය යෙදිය යුතුය.
5) පිටුවේ පහත කෙළවරේ පිටු අංක යෙදිය යුතුය.
6) විමර්ශිත ග්‍රන්ථ සඳහන් කිරීමේ දී APA ක්‍රමය භාවිත කළ යුතුය.

■ සියලුම ලිපි ඒ ඒ විෂය පිළිබඳ ප්‍රවීණයන්ගෙන් සමන්විත කමිටුවක් මගින් සමාලෝචනය කෙරේ.

වැඩිදුර තොරතුරු දුරකථන අංක **0112 777328** මගින් ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ මාධ්‍ය නිලධාරි එදිරවීර ගුණසේකර මහතා ඇමතීමෙන් ලබාගත හැකිය.(සතියේ දිනවල පෙ.ව **08.30** සිට ප.ව **04.15** දක්වා)

ලිපි **2021/05/10** වන දිනට පෙර පහත ඊමේල් ලිපිනය වෙත එවීමට කාරුණික වන්න.
**ediriweera_g@parliament.lk**

අධ්‍යක්ෂ - සන්නිවේදන,
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව,
ශ්‍රී ජයවර්ධනපුර,
කෝට්ටේ.

# ඡායා ගැලරිය

කථානායකතුමා පකිස්ථාන මිත්‍ර සබඳතා තර කරයි...







පොත් බෙදා දීමේ උත්සවය






සන්නිවේදන දෙපාර්තමේන්තුව,
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව,
ශ්‍රී ජයවර්ධනපුර,
කෝට්ටේ.

දුරකථනය : +94 11 2777100
ෆැක්ස් : +94 11 2777227

Parliament of Sri Lanka

@ParliamentLK

@slparliament

Parliament of Sri Lanka